# රාජ්‍ය ආදායම ඉහළට

වසර 2015 වඩා 2019 දී රාජ්‍ය ආදයමේ වර්ධනයක් දක්නට ඇතැයි මහා භාණ්ඩාගාරය ප්‍රකාශ කරයි.

වසර 2015 දී දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 10%ක මට්ටමක පැවති රාජ්‍ය ආදයම, රාජ්‍ය බදු ආදයම 2019 වන විට 15% දක්වා වැඩි වී ඇතැයි මහා භාණ්ඩාගාරය නිකුත් කළ අලුත්ම වාර්තාවල දැක්වේ.

මේ අන්දමට රාජ්‍ය ආදයම වැඩිකර ගැනීමට රජය සමත් වූයේ සාර්ථකව ආර්ථිකය කළමනාකරණය කර ගැනීමට කටයුතු යෙදීම නිසා බව එම වාර්තාවේ දැක්වේ.

රජයේ ආදයම වසරින් වසර වැඩිවීම නිසා 2019 දී ප්‍රාග්ධන වියදම ඉහළ නංවා ගැනීමට හැකි වූ බව එම වාර්තාවේ දැක්වේ.

වසර 2016 දී රාජ්‍ය ආදයම දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 14.2%ක් පැවති අතර 2019 වන විට 15% ක වර්ධනයක් දක්වා ගෙන ඒමට රජය බලාපොරොත්තු වන අතර 2020 - 2022 දී 17%ක් දක්වා වැඩිකර ගැනීමට අපේක්ෂා කරන බව මහා භාණ්ඩාගාරයේ අලුත්ම වාර්තාවේ දැක්වේ.

රාජ්‍ය බදු ආදයම වැඩිකර ගන්නා අතර ජනතා සුබසාධනය හා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනට වැය කරන මුදල ද ඉහළ දැමීමට සැලසුම් කර ඇතැයි එම වාර්තාවේ දැක්වේ.

**ජයසිරි මුණසිංහ**